# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: 06/2018

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2018 අප්‍රියෙල් මස 05 දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>විශ්වවිද්‍යාල පරිපාලනමය හා මූල්‍ය නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන</u>

2014 සැප්තැම්බර් 23 වන දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 13/2014 ප්‍රකාරව, පරිපාලන හා මූල්‍ය නිලධාරීන් ඔවුන්ගේ වර්තමාන තනතුරු වල ස්ථිර කිරීම සඳහා සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන සම්පූර්ණ කර තිබීම අනිවාර්ය අවශ්‍යතාවයක් බවට පත් කර ඇති බව 2018.03.08 දින පැවති සිය 982වන සභා වාරයේ දී කොමිෂන් සභාවේ අවධානයට ලක් විය.

පරිවාස කාලය සාර්ථකව නිම කර ඇතත්, ඔවුන්ගේ සේවා ස්ථිරත්වය සඳහා පූර්ව අවශ්‍යතාවක් වන සේවාරම්භක පුහුණු වැඩසටහන සම්පූර්ණ නොකිරීම හේතුවෙන් වර්තමාන තනතුරුවල ස්ථිර කර නොමැති පරිපාලනමය හා මූල්‍ය නිලධාරීන් පද්ධතියේ සිටින බවට තවදුරටත් කොමිෂන් සභාවේ අවධානය යොමු විය.

ඒ අනුව, ලබා ගත හැකි පළමු අවස්ථාවේදී ම ඔවුන් එම පුහුණු වැඩසටහන සම්පූර්ණ කළ යුතුය යන කොන්දේසියට යටත්ව. පරිවාස කාලය අවසන් කිරීම මත අනෙකුත් අවශ්‍යතාවයන් සාර්ථකව සාර්ථකව සපුරා ඇත්නම් පරිපාලනමය සහ මූල්‍ය නිලධාරීන් ඔවුන්ගේ වර්තමාන තනතුරුවල ස්ථිර කළ යුතු බව කොමිෂන් සභාව විසින් ඉහත සභා වාරයේ දී තීරණය කරන ලදී.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අත්. කළේ / මහාචාර්ය මොහාන් ද සිල්වා**
සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී/එච්ආර්/11